# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2394/36 – 2024 ජූලි මස 24 වැනි බදාදා – 2024.07.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2018/04.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.10.03 දිනැති හා අංක 2091/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රාක සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.09.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 02, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, අංක 457 හි පිහිටි සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය ( දිල්කුෂා ද සිල්වා මිය වෙනුවෙන්) සහ අනෙක් පාර්ශ්වය වශයෙන් මොරටුව කටුබැද්ද හි පිහිටි නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A71/2018 හා 2024.05.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල්

2024 ජූලි මස 04 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 042300 – 18 (2024/07)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය : IR/COM/04/2018/04

කාර්මික අධිකරණයේ දී ය.

1. සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය ,
නො. 457, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත,
කොළඹ 02.
(දිල්කුෂා ද සිල්වා මිය වෙනුවෙන්)

*පළමු පාර්ශ්වය*

නඩු අංකය: A/71/2018

සහ

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය,
කටුබැද්ද,
මොරටුව,

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල

**ප්‍රදානය**

කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු රවීන්ද්‍ර සමරවීර මැති තුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන ) පනත් වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2018.09.20 දිනැති නියෝගයෙන් බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

**ආරාවුලට හේතු වී ඇති කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ:

" නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ රහස්‍ය ලේකම් MM I-1 (1I) තනතුර දරන දිල්කුෂා ද සිල්වා මහත්මියට MM 1-I (1 ශ්‍රේණියට) අදාළ උසස් වීම ලබා නොදීමෙන් අගතියක් සිදු වී ඇත්ද? එසේ නම් ඇයට ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ".

**පෙනී සිටීම**

මෙම නඩුවේ පළමුවැනි පාර්ශ්වය ලෙස සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, තම සංගමයේ සාමාජිකාවක් වන දිල්කුෂා ද සිල්වා මහත්මියට අසාධාරණයක් සිදු වී යයි පවසමින් කර ඇති පැමිණිල්ලක් අනුව මෙම බේරුම්කරණ නඩු නිමිත්ත උපචිත වී ඇත. සහනයක් පතන දිල්කුෂා ද සිල්වා මහත්මිය සහ සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමයේ ලේකම්වරයා නඩු කටයුත්තේ විභාගයන් පැවති දින තුනක දී හැර සෑම අවස්ථාවකටම සහභාගි විය. ආරම්භයේ දී මූලික ප්‍රකාශය සහ දෙවැනි ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ පටන් බේරුම්කරණ විභාගය අවසන් වන දින තෙක් පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටියේ බලය පවරන ලද නියෝජිත සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමයේ ප්‍රධාන ලේකම් එච්. ඒ. පියදාස මහතා ය.

දෙවැනි පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත්) ඩී. එච්. සී. ජයරාණි මහත්මිය පරීක්ෂණය පැවැත්වුණු සෑම දිනක ම පාහේ සහභාගි විය. ඊට අමතර ව කාර්යාල සහකාර නිල්මිණි කැටිපෙආරච්චි මහත්මිය දින කීපයක් සහභාගි විය. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් නඩුවේ ආරම්භයේ සිට ප්‍රධාන වශයෙන් පෙනී සිටියේ නීතිඥ අනුරාධා රණසිංහ මහත්මියයි. ඇතැම් දිනවල දී නීතිඥ සසිත ද සිල්වා මහතා, නීතිඥ අයේෂා මෙන්ඩිස් මහත්මිය සහ ප්‍රසාද් කාරියවසම් මහතා යන අය ද වරින් වර දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටියහ.

**බේරුම්කරණ විභාග පටිපාටිය**

මෙම නඩුව 2019.02.28 දින පළමු වතාවට කැඳවනු ලැබුණි. එදින පාර්ශ්වයන් දෙක ම වෙනුවෙන් කිසිවෙකු සහභාගි නොවී ය. පළමු සහ දෙවැනි ප්‍රකාශයන් පාර්ශ්වයන් දෙකට ම හුවමාරු කර භාරදෙනු ලැබ, ඒවා ද සැලකිල්ලට ගෙන විභාගයකට අවතීර්ණ නොවී දෙපාර්ශ්වයේ එකඟතාව මත කිසියම් සාධාරණ සමථයකට එළඹිය හැකි ද යන්න පිළිබඳ දැඩි උත්සාහයක් ගන්නා ලදී. එබඳු සමථයකට දෙපාර්ශ්වය ගෙන ඒම අපහසු වූයෙන් විභාගය ඇරඹුණි. නඩුව 2019.02.28, 2019.05.10, 2019.09.25, 2019.10.21, 2020.02.05, 2020.08.10, 2021.01.11, 2022.01.11, 2022.03.16, 2022.04.07, 2022.10.26, 2022.11.10, 2022.12.09 සහ 2023.01.12 යන දිනයන් 14 කට කැඳවා විභාගය පවත්වන ලදී. දින නියම කරන ලද නමුත් 2019.07.05, 2019.12.02, 2020.04.08, 2020.09.15, 2021.02.15 සහ 2022.05.27 යන දිනයන්හි දී පරීක්ෂණ විභාගය නොපැවැත්විණි.

මෙම බේරුම්කරණ විභාගයේ දී හබයකින් තොර ව පළමුවැනි පාර්ශ්වය සාක්ෂි විභාගය පළමුවෙන් ආරම්භ කළ අතර, එම පාර්ශ්වය වෙනුවෙන් සහනය පතන දිල්කුෂා ද සිල්වා මහත්මිය වෙනුවෙන් ඇයගේ මූලික සාක්ෂිය විභාග කෙරුණි. පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් මෙහෙයවනු ලැබූ එක ම සාක්ෂිය එය පමණක් වූ අතර A1 සිටA19 දක්වා ලේඛන ගොනු කරමින් පළමුවැනි පාර්ශ්වයේ නඩුව අවසන් කරන ලදී. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත්) ඩී. එච්. සී.ජයරාණි මහත්මියගේ දිවුරුම් පෙත්සමක් මගින් ඉදිරිපත් වූ සාක්ෂිය මෙහෙයවනු ලැබුණි. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් X1 සිට X9 දක්වා ලේඛන ලකුණු කොට ඉදිරිපත් කෙරුණි.

පළමු වන පාර්ශ්වයේ ප්‍රධාන ඉල්ලීම වන්නේ නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වසර තිස් එකකට ආසන්න කාලයක් සේවය කොට විශ්‍රාම ලැබූ එහි රහස්‍ය ලේකම් තනතුර දරමින් සිටි දිල්කුෂා ද සිල්වා මහත්මියට ලැබිය යුතු වූ සේවා උසස්වීමක් නොලැබීමෙන් ඇයට අසාධාරණයක් සිදු වූ බවයි.

දිල්කුෂා ද සිල්වා මහත්මිය 1988.05.10 වැනි දින ආයතනයේ දෙවැනි ශ්‍රේණියේ ලේකම්වරියක ලෙස සේවයට බැඳීමෙන් පසුව 1991 වර්ෂයේ දී එම ශ්‍රේණියේ පළමුවැනි පන්තියට උසස් වූ අතර 2016.03.01 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ රහස්‍ය ලේකම් තනතුරට පත් කරනු ලැබ ඇත. ඇය 2019.05.15 වැනි දින සේවයෙන් විශ්‍රාම ගෙන ඇත.

මෙම ආරාවුලට සම්බන්ධ ලැබිය යුතු තනතුරෙහි ඉල්ලුම්කාරිය නොතැබීමේ ගැටළුව සම්බන්ධයෙන් 2006.09.22 දිනැතිව භාණ්ඩාගාරය මගින් නිකුත් කර ඇති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 30හි ප්‍රතිපාදන අදාළ වේ. 2006 වර්ෂයේ දී රාජ්‍ය සේ-වයේ වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අංකඃ 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය රාජ්‍ය සේවයේ නියැලී සියලු රාජ්‍ය සේවක-යින් වෙනුවෙන් නිකුත් කරන ලද අතර, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුලු අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින් සඳහා අදාළ වන සේ ඉහත කී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංකඃ 30 නිකුත් කරන ලදී. එම චක්‍රලේඛයේ III වැනි ඇමුණුමේ අංකඃ78 යටතේ නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය උපලේඛනගත කොට ඇත. එම චක්‍රලේඛයේ ප්‍රතිපාදන මෙම ආරාවුලේ නිගමනයන් සම්බන්ධයෙන් ඍජුව අදාළ වේ.

**පළමුවන පාර්ශ්වයේ ස්ථාවරය**

සම්පිණ්ඩනය කර ගත් කළ පළමුවන පාර්ශ්වයේ ස්ථාවරය දිල්කුෂා මහත්මිය දැරූ තනතුර ඉහත කී චක්‍රලේඛය යටතේ ආයතනයේ සේවාවන් ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර විධායක තනතුරකි. එකී ප්‍රතිව්‍යුහගත කිරීමට පාදක කරගෙන ඇත්තේ ඒ වන විට බලාත්මකව පැවැති බඳවා ගැනීම් සහ උසස් වීමේ පටිපාටිය වන අතර ඒ යටතේ ඇය දැරූ රහස්‍ය ලේකම් තනතුර $B_2$, $S_3$, A වැටුප් කාණ්ඩයට ඇතුළත් වී ඇත. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංකඃ 30 ප්‍රකාරව ඊට අනුරූපී වූ වැටුප් කාණ්ඩය MM I-I වේ. ඒ අනුව 2008.04.01 දිනැති වැටුප් පරිවර්තන ලිපියේ ඇය දැරූ රහස්‍ය ලේකම් තනතුර මධ්‍යම කළමනාකරණ (Middle Manager) MM 1-1 කාණ්ඩයට ඇතුළත් කොට රු.25,640/= න් ඇරඹෙන වැටුප්තලයේ වැටුප් වර්ධක පහක් ඇතුළත් කොට රු 29,105/=ක වැටුපකට හිමිකම ලැබෙන සේ පිහිටුවා ඇත.

ඉහත කී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංකඃ 30 ප්‍රකාරව තවදුරටත් ආයතනයේ සේවාවන් ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව 2010.01.28 වැනි දින ලිපියෙන් රහස්‍ය ලේකම් තනතුර තත්කාලීන ව දරන්නන්ට පුද්ගලික වන සේ MM I-I කාණ්ඩයේ II ශ්‍රේණියට ඇතුළත් කොට ඇත. අනතුරුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2012 වර්ෂයේදී කරන ලද තවත් සංශෝධනයක දී රහස්‍ය ලේකම් තනතුර කනිෂ්ඨ කළමනාකරණ ගණයට JM වශයෙන් කාණ්ඩ කරනු ලැබ ඇත. කෙසේ වුවත් ඒ වන විටත් තනතුර දරන්නෙකු ලෙස සිටි බැවින් දිල්කුෂා මහත්මියට පෞද්ගලික වන සේ ඇය MM 1-1 කාණ්ඩයට ඇතුළත් කොට ඇත.

ඉන්වන අවාසිය සමනය කර ගැනීම සඳහා තමා රහස්‍ය ලේකම් 1 ශ්‍රේණියට උසස් කරන ලෙස කරන ලද ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ආයතනය විභාගයක් පවත්වන බව දැනුම් දීමක් කරනු ලැබුවත් එසේ නොකළ බවට ඇය චෝදනා කරයි.

2010.01.28 වැනි දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ ශ්‍රේණිගත කිරීමට අනුව තමා MM 1-1 කාණ්ඩයේ 11 ශ්‍රේණියට පත්කොට උසස්වීම් අදියර ලෙස MM I-I කාණ්ඩයේ I ශ්‍රේණියට යාමට හැකිවන සේ නියමිත තනතුරේ පිහිටුවීම කළ යුතු වුවත් ආයතනයේ කළමනාකාරිත්වය එය පැහැර හැරිය බැවින් තමාට බලවත් අසාධාරණයක් වූ බව ඇය කියා සිටී. තවද ඇය A4 ලෙස ලකුණු කළ ලේඛනයේ විධිවිධාන ප්‍රකාර ව තමා නිසි කලට MM 1-1 කාණ්ඩයේ II ශ්‍රේණියේ රහස්‍ය ලේකම් තනතුරේ පිහිටුවූයේ නම් අවුරුදු හයක් ඇවෑමෙන්, එනම් 2012 වර්ෂයේ දී ඇය MM 1-1 කාණ්ඩයේ I ශ්‍රේණියේ තනතුරට උසස්වීම් ලබන බව ද කියා සිටී.

A19 ලෙස ලකුණු කළ ලේඛනය මගින් තමාට සිදු වූ මූල්‍යමය අලාභ ද ගණනය කොට ඉදිරිපත් කොට ඇත.

**දෙවන පාර්ශ්වයේ ස්ථාවරය**

මූලික විරෝධතාවක ස්වරූපයෙන් දෙවන පාර්ශ්වය කියා සිටියේ පරීක්ෂණය පැවැත්වෙන කාලය වන විට දිල්කුෂා මහත්මිය විශ්‍රාම ගොස් සිටි බැවින් ඇයට උසස්වීමක වාසියක් ලබා ගැනීම ලබාදීමට නොහැකි බවයි. දෙවන පාර්ශ්වයේ නිශ්චිත ස්ථාවරය වන්නේ දිල්කුෂා මහත්මිය ඉල්ලා සිටින තනතුරේ පිහිටුවීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමතියක් ලබා නොදුන් බවයි. A4 සහ X6 ලෙස දෙපාර්ශ්වයෙන්ම ලකුණු කර ඇති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය ආයතනයේ සමස්ත සේවක ප්‍රජාවටම අදාළ වන්නක් මිස දිල්කුෂා මහත්මියට පමණක් බලපාන්නක් නොවන බවයි. කෙසේ වුවත් 2007.03.22 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය (X4) මගින් ඇයට MM I-I වැටුප ලබා දී ඇත්තේ එවකට ඇය ලබමින් සිටි වැටුප පාදක කරගෙනය. (X5) ලෙස ලකුණු කළ ලිපිය මගින් ඇයගේ රහස්‍ය ලේකම් තනතුර JM 1-2 මට්ටමට පහළ හෙළා ඇතත්, ඇයට පෞද්ගලික වන සේ MM 1-1 තනතුරට හිමි වැටුප දිගටම ගෙවාගෙන ගොස් ඇත.

A4 සහ X6 ලෙස ලකුණු කළ 2010.01.28 දිනැති ලිපිය ප්‍රකාරව ඉල්ලුම්කාරිය MM I-I කාණ්ඩයේ 11 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට හැකියාව ඇති බව දැක්වුව ද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංකඃ 30 හි ප්‍රතිපාදන ප්‍රකාරව ප්‍රථමයෙන් ආයතනයේ බඳවා ගැනීම් සහ උසස්වීම් පටිපාටිය සකස් කරගත යුතුව තිබුණු බව කියා සිටී. තවද 2008.01.14 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ උපදෙස් උල්ලංඝනය කිරීමට ආයතනයට නොහැකි බවද කියා සිටී.

2012.11.19 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ බඳවා ගැනීම් සහ උසස්වීම් පටිපාටිය අනුව රහස්‍ය ලේකම් තනතුර MM 1-1 ගණයට ඇතුළත් කර නොමැති අතර එය JM 1-2 වන ශ්‍රේණියේ තනතුරක් ලෙස කාණ්ඩ කර ඇති බවද කියා සිටී. තවද MM 1-1 තනතුරු සඳහා බඳවා ගැනීමේදී උපාධිය සුදුසුකමක් ලෙස අවශ්‍ය වන අතර දිල්කුෂා මහත්මියට එම සුදුසුකම් නොමැති බවත්, ලේකම් තනතුරට මුලින්ම ඇතුළත් කර ගැනීමේදී අ.පො.ස. (සා.පෙ) සුදුසුකම් වලින් සේවයට ඇතුළු වී ඇති අතර, එහිදී ද විෂයයක් වශයෙන් ගණිතය සමත් වී නැති බව ද කියා සිටී. කාර්ය සාධන විභාගයක් පැවැත්වීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නවත්වා ඇති බැවින් ඇය ඉල්ලා සිටි අභ්‍යන්තර විභාගයක් පැවැත්වීමට නොහැකි වූ බව ද කියා සිටී. ඒ අනුව දිල්කුෂා මහත්මියට ලබා දී ඇති තත්ත්වයන්ට වඩා කිසිදු උසස් වීමක් ලබාදීමට ආයතනයට නොහැකි බවත් පෙන්වා දී ඇත.

**නිරීක්ෂණ සහ නිගමන**

දිල්කුෂා මහත්මිය MM 1-1 කාණ්ඩයේ II ශ්‍රේණියේ තනතුරක පිහිටුවා නැතත් වැටුප් අවාසියක් නොවන සේ MM I - I කාණ්ඩයට හිමි වැටුප විශ්‍රාම ගන්නා තෙක් ඇයට ලබා දී ඇත. තවද එම කාණ්ඩය ඇයට පෞද්ගලික වන සේ ක්‍රියාත්මක කොට ඇත.

කැටිකොට ගත් කළ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ක්‍රියාත්මක වීමේදී MM 1-1 කාණ්ඩයේ II ශ්‍රේණියේ තනතුරක පිහිටුවීම පිළිබඳ ඉල්ලුම්කාරියගේ ඉල්ලීම සලකා බැලීමේ දී මෙහෙයවන ලද සාක්ෂි සහ ලකුණු කොට ඉදිරිපත් කරන ලද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ආයතනයට එවන ලද ලිපිවල අඩංගු උපදෙස් ඉතා වැදගත්ය. පරීක්ෂණයේදී පහත සඳහන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපි ඉදිරිපත් විය.

| ලිපිය ලකුණු කළ පාර්ශ්වය | ලකුණු කළ අංකය | ලිපියේ දිනය |
|---|---|---|
| 1. දෙවන පාර්ශ්වය | X4 | 2007.03.25 |
| 2. දෙවන පාර්ශ්වය | X5 | 2008.01.14 |
| 3. පළමුවන පාර්ශ්වය | A4 | 2010.01.28 |
| 4. දෙවන පාර්ශ්වය | X6 | 2010.01.28 |
| 5. දෙවන පාර්ශ්වය | X7 | 2010.08.23 |
| 6. දෙවන පාර්ශ්වය | X8 | 2012.11.19 |

එම ලිපිවල රහස්‍ය ලේකම් තනතුරට අදාළ ව තිබුණු සටහන් පහත දැක්වේ.

1. X4

| Current Designation /Post | Current Class/Grade | New Group | Salary Code | Step No. | Appropriate Salary Step |
|---|---|---|---|---|---|
| Confidential Secretary | 2-3 A | Manager | MM 1-1 | 01 | 25,640 |

2. X5

| | Present Status | | Proposed for Restructuring | | |
|---|---|---|---|---|---|
| Appropriate Initial Salary | Salary Code | Appropriate Salary step | Approved Salary | Salary Code | Promotional Grade |
| 15,955 | MM I-I | 01 | 25,640 | JM 1-2 | II |

3. X4 and A6

Present Situation — Restructured Posts

| Current Post | Appropriate salary Scale | Appropriate Salary step | Salary Code | Placement Grade | Next Promotional Grade |
|---|---|---|---|---|---|
| 2-3A | 15,955/= | 25,640/= | MM 1-1 | II | I |

4. X7

| Designation | Approved cadre for 2010 |
|---|---|
| Conf' Secretary (*) MM I-I | ------- |

5. X8

2012.11.19 දිනැති ලිපිය සමග අනුමත කළ සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටි ඇතුලත් උපලේඛනය (ඒ පිළිබඳ සඳහනක් ඇතත් උපලේඛනය ලකුණු කොට ඉදිරිපත් කර නැත)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිවල ඇතුළත් කොට ඇති ඉතා වැදගත් කරුණක් වන්නේ තරු ලකුණක් (*) යොදා පැහැදිලි කරමින් රහස්‍ය ලේකම් තනතුරේ දැනට සේවයේ යෙදී සිටින නිලධාරිණියට පෞද්ගලික වන සේ ඇයගේ තනතුර MM 1-1 කාණ්ඩයට අදාළව පැවතිය යුතු බව සටහන් කිරීමය.

මෙහි දී දිල්කුෂි මහත්මියගේ බලවත් දුක්ගැනවිල්ල වී ඇත්තේ ආයතනය තමාට හිමි විය යුතු නෛතික අයිතියක් ලබා දීම පැහැර හැර ඇති බවට ය.

දෙවන පාර්ශ්වය දැඩි උත්සාහයක් ගත්තේ සේවාවන් ප්‍රතිව්‍යුහගත කිරීමේ වගකීම සහමුලින්ම තිබෙන්නේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සතු බැවින් මෙම උසස් වීම පිළිබඳ තමාට කිසිවක් කළ නොහැකි බව තහවුරු කිරීමට ය. එහෙත් ඉහත කී

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපි සියල්ලම ඇතුලත් වන කාර්ය මණ්ඩල තත්ත්වයන් පිළිබඳව තීරණ ගනු ලැබ ඇත්තේ ආතර් සී ක්ලාක් ආයතනයේ කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කිරීමෙන් පසු වය. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ආයතනයන්හි කාර්යමණ්ඩල පිළිබඳ තීරණවලට එළඹෙනුයේ අදාළ ආයතන සපයන දත්ත සහ තොරතුරු මත ය.

ඉහත වගුවේ අංකඃ 1 හි සඳහන් ලිපිය එවද්දී රහස්‍ය ලේකම් තනතුර මෙම නිලධාරිනියට පෞද්ගලික වන සේ MM 1-1 කාණ්ඩයට ඇතුළත් කර තිබී ඇත. පසුව වැඩිමනත්ව කෙරුණ සාකච්ඡා පදනම් කරගත් තීරණ මත එවූ ඉහත අංකඃ 2 ලිපියේ යෝජිත තනතුරු කාණ්ඩය වශයෙන් JM 1-2 ලෙස විය යුතු බවට දැනුම් දෙනු ලැබ ඇත. කෙසේ වුවත් ඉහත අංක : 3න් පෙන්වන ලිපියෙන් පැහැදිලිව දක්වා ඇත්තේ දැනට එම තනතුර දරන නිලධාරිනියට පෞද්ගලික වන සේ MM 1-1 කාණ්ඩයේ II ශ්‍රේණිය හිමි විය යුතු බවටත් සහ එහි උසස් වීමේ MM 1-1 කාණ්ඩයේ 1 බවටත් තීරණය කරමිණි. ආයතනයේ කළමනාකාරිත්වය එම චක්‍රලේඛයේ උපදෙස් ක්‍රියාත්මක කොට නැත. සැබැවින් කර ඇත්තේ පිහිටුවිය යුතු සහ උසස්වීම් පියවර විය යුතු තලයන් අමතක කරමින් වැටුපට පමණක් හිමිකම ලබාදීමය. ඊට පසුව, වගුවේ අංකඃ 4 යටතේ සඳහන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් එවා ඇති ලිපියේ වුවද දැක්වෙන්නේ දැනට සිටින නිලධාරියාට පෞද්ගලික වන සේ MM 1-1 තනතුරේ කාණ්ඩයට අයත් විය යුතු ලෙසයි.

මෙහිලා ආයතනයෙන් කෙරුණු නිර්දේශවලට බලපා ඇත්තේ ඉල්ලුම් කාරියගේ අධ්‍යාපන සුදුසුකම්වල අඩුව බව සාක්ෂි විභාගයේ දී පැහැදිලි වූ කරුණකි. එම තනතුර සඳහා උපාධියක අවශ්‍යතාවක් ගැන සඳහන් කරන නමුත් එය සනාථ කිරීම සඳහා 2012 වර්ෂයේදී සකස් කොට අනුමත කරවා ගත්තා යැයි දෙවන පාර්ශ්වයේ සාක්ෂිකාරියගේ දිවුරුම් පෙත්සම් සාක්ෂියේ අංකඃ25 සිට ඇති ඡේද ගණනාවකින් විස්තර කර ඇතත් අදාළ කරුණු සනාථ කිරීම සඳහා එකී බඳවා ගැනීම් සහ උසස් කිරීම් පටිපාටියේ අදාළ උධෘතයක් ලකුණු කොට මෙම පරීක්ෂණයේ දී ඉදිරිපත් කළේ නැත. ඒ නිසා අනුමත බඳවා ගැනීම් සහ උසස්වීම් පටිපාටියේ නිශ්චිතව කුමක් සඳහන්ව තිබේදැයි දැනගැනීමට නොහැක. කෙසේ වුවත් ඇයට උපාධියක් නොමැති බවත්, අධ්‍යාපන සුදුසුකම් ලෙස ඇත්තේ අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේ විෂයයන් හයක් සමත් වී තිබීම පමණක් බවත්, එහිදී වුව ද ගණිතය සඳහා සාමාර්ථයක් නොමැති බවත් නිශ්චිතව සනාථ වී ඇති කරුණුය. කෙසේ වුවත් දිල්කුෂා මහත්මිය ආයතනයේ සේවයට බඳවා ගැනීමේදී අදාළ වූ ලේකම් තනතුර සඳහා වූ පුවත්පත් නිවේදනයේ (A8) සහ එවකට පැවැති බඳවා ගැනීම පටිපාටිය (A6) ලේඛන ප්‍රකාරව අවශ්‍ය සුදුසුකම් ඇය සපුරා තිබුණු බවට සැකයක් නැත. අවම සුදුසුකම් සපුරා නොතිබුණේ නම් ඇය ආයතනයේ සේවය සඳහා තෝරා නොගනු ඇත. බඳවා ගනු ලැබූ නිලධාරිනියට තම තනතුරේ උසස්වීම් ලබා ගැනීමේ සාධාරණ අපේක්ෂාවක් (Reasonable expectation) තිබීම පිළිගත යුතු කරුණකි. ඒ අනුව සේවයට බැඳී වසර කීපයකින් පසුව ඇය 1991 වර්ෂයේ දී පළමුවැනි ශ්‍රේණියටත්, 2006 වර්ෂයේ දී රහස්‍ය ලේකම් තනතුරටත් උසස්වීම් ලබා ඇත. බඳවා ගැනීමේ සහ උසස්වීම් පටිපාටිවල පසුව කෙරෙන සංශෝධනවලදී තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම්වල ඉහළ දැමීමක් සිදුකරනු ලැබුවද, ඉන් තනතුරේ නියැලී සිටින අයට බලපෑමක් සිදු නොවිය යුතු වේ. අදාළ තනතුරට අනාගතයේදී බඳවා ගනු ලබන නිලධාරීන් සම්බන්ධයෙන් එම සංශෝධිත තත්ත්වයන් බලපෑ යුතුය. මේ තත්ත්වය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින්ද පිළිගෙන ඇති බව දිල්කුෂා මහත්මියට පෞද්ගලික වන සේ MM 1-1 තනතුරේ ඇය තැබීමෙන් පැහැදිලි වේ.

තමන් අසාධාරණයට ලක් වූයේ යැයි සාධාරණ පරීක්ෂණයක් පවත්වන ලෙස දිල්කුෂා මහත්මිය ඇතුළු නිලධාරීන් කීප දෙනෙකු විසින් කරන ලද ඉල්ලීමක් (A9) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2015.05.26 වැනි දින අනුමත කර ඇත. කෙසේ වුවත් සාධාරණ පරීක්ෂණයක් පැවැත්වීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකිරීමේ හේතුවෙන් එය ද වැලකී ගොස් ඇත. සැබවින්ම විය යුතු වූයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉහත කී පරිදි නිසි ලෙස දත්ත ලබා දී සාකච්ඡාවකින් පසුව ඉහත වගුවේ අංක 3 යටතේ දක්වා ඇති A4 සහ X6 ලෙස ලකුණු කළ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ සඳහන් පරිදි දිල්කුෂා මහත්මිය ඇයට පෞද්ගලික වන සේ අදාළ තලයේ පිහිටු වීමය.

දෙපාර්ශ්වයේ ම පළමුවැනි සහ දෙවැනි ප්‍රකාශයන්හිත්, සාක්ෂි විභාගයේ දීත්, දෙපාර්ශ්වයේ අවසන් ලිඛිත සැළකිරීම්වලත් ඉදිරිපත් වූ සියලු කරුණු නීතියටත්, සාධාරණත්ව මූලධර්මවලටත් අනුකූල ව සළකා බැලීමෙන් පසුව ඉල්ලුම් කාරිය දිල්කුෂා ද සිල්වා මහත්මිය ඉහත කී A4 සහ X6 ලෙස ලකුණු කළ ලිපිය ප්‍රකාරව තනතුරෙහි නොපිහිටුවීමෙන් ඇයට අසාධාරණයක් සිදු වී ඇති බවට නිගමනය කරමි.

මෙහිදී ඇයට අසාධාරණයක් වී ඇති බවට නිගමනය කෙරෙන බැවින් සහනයක් සැලසීමේදී උපයෝගී කරගත හැකි එකම ලේඛනය වන්නේ A19 ලෙස ලකුණු කර ඉදිරිපත් කළ ලේඛනයයි. එම ලේඛනය ලකුණු කොට ඉදිරිපත් කළ අවසන් පරීක්ෂණ දිනයේදී එම ලේඛනය සම්බන්ධයෙන් විරෝධතාවක් ඇතොත් තම අවසන් ලිඛිත සැලකිරීම් වලදී කරුණු ඉදිරිපත් කරන ලෙස පාර්ශ්වයන්ට දැනුම් දෙනු ලැබුවත් දෙවන පාර්ශ්වයේ අවසන් ලිඛිත සැලකිරීම් වලදී ඒ පිළිබඳ කිසිදු විරෝධතාවක් පළ වී නැත. එම A19 ලේඛනය දෙවන පාර්ශ්වයේ සැලකිල්ලට භාජනය වී ඇති බව ඔවුන්ගේ 2023.04.06 දිනැති අවසන් ලිඛිත සැලකිරීම් වල පළමුවැනි ඡේදයේ ලකුණු කළ ලේඛන පිළිබඳ සටහනෙන් තහවුරු වේ.

ඒ අනුව ඇයට දිය යුතු සහනය වශයෙන්, වෛකල්පිත වශයෙන් MM I-I කාණ්ඩයේ 1 ශ්‍රේණියට උසස් වීම 2012 වර්ෂයේ දී ඇයට හිමි වන්නේ යැයි සලකා ගණනය කරමින් සකස් කොට ඉදිරිපත් කර ඇති හිඟ වැටුප, හිඟ සේවක අර්ථසාධක අරමුදල්, හිඟ සේවක

හාර අරමුදල් සහ පාරිතෝෂික දීමනා වෙනස ඇතුලත් A19 ලේඛනයෙන් ඉල්ලා ඇති පරිදි ගෙවිය යුතු බවට නිගමනය කරමි.

**ප්‍රදානය**

පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කාරිය වන දිල්කුෂා ද සිල්වා මහත්මියට සිදු වී ඇති මූල්‍යමය පාඩුව පිරිමැසීම අරමුණු කරගෙන හිඟ වැටුප ලෙස රු 194740.25 (රුපියල් එක්ලක්ෂ අනූහතර දහස් හත්සිය හතලිහයි සත විසිපහ) දෙවන පාර්ශ්වය වන සේවායෝජක ආයතනය විසින් මෙම ප්‍රදානය ගැසට් ගත වී මසක් ඇතුලත දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කල යුතුය.

මෙම ප්‍රදානය හේතුවෙන් පළමු පාර්ශ්වයට ලබාගැනීමට ඇති වෙනත් කවර හෝ ව්‍යවස්ථාපිත දීමනා ලබාගැනීමට මෙම ප්‍රදානය බාධාවක් නොවිය යුත්තේය.

මෙම තීරණය සාධාරණ සහ යුක්තිගත ප්‍රදානයකි.

එස්. විරිතමුල්ල,
බේරුම්කරු

2024 මැයි මස 20 වැනි දින
කාර්මික අධිකරණයේ දී ය.

EOG - 07 - 0230

---

මගේ අංකය: IR/COM/04/2020/268.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2022.08.08 දිනැති හා අංක 2292/08 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.07.28 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බෙම්මුල්ල, මාහේන, අංක 92/10, ඩබ්. ඩී. ටී. එස්. ක්‍රිශාන්ත මයා බාරේ හි පිහිටි ලෙකෝ ආදායම් නිලධාරීන්ගේ එකමුතුව සහ කොළඹ 03, ගාලු පාර, ඊ.එච්. කුරේ ගොඩනැගිල්ල, අංක 411, 3 වන මහල හි පිහිටි සී/ස විදුලි පෞද්ගලික සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/39/2022 හා 2024.06.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජුලි මස 15 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය

ලෙකෝ ආදායම් නිලධාරීන්ගේ එකමුතුව,
ඩබ්. ඩී. ටී. එස්. ක්‍රිෂාන්ත මයා බාරේ,
අංක 92/10, මාහේන,
බෙම්මුල්ල.

*ඉල්ලුම්කාර පාර්ශ්වය*

*එදිරිව*

ආරාවුල් අංකය: IR/COM/04/2020/268
නඩු අංකය: A/39/2022

සී/ස විදුලි පුද්ගලික සමාගම,
01 වන මහල,
ඊ.එච්. කුරේ ගොඩනැගිල්ල,
අංක 411, ගාලු පාර,
කොළඹ 03.

*වගඋත්තරකාර පාර්ශ්වය*

ප්‍රදානය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2022.07.28 වන දින නියෝගයෙන් බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ආරාවුලට හේතු වී ඇති කරුණය

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කර්මික ආරාවුල හේතු වී පවත්නා කරුණු වනුයේ,

''සී/ස විදුලි පුද්ගලික සමාගමේ සේවය කරන පහත නම් සඳහන් පැමිණිලිකරුවන් 19 දෙනා විසින් ඉල්ලා සිටින ලද A-5 වැටුප් තලය සඳහා හිමිකම් තිබේද ? තිබේ නම් සිදු වී ඇති අසාධාරණය සම්බන්ධයෙන් ඔවුන්ට හිමි විය යුතු සහනයන් කවරේද ? කවරදාසිට ද? යන්න පිළිබඳව වේ.''

1. එම්.ඩී.එම්.ජේ. ෆ්‍රැන්සිස් මයා
2. පී.ඒ.ඩී.අයි. ජයන්ත පෙරේරා මයා
3. ඩබ්ලිව්.එන්. ප්‍රියංකර මයා
4. ඒ.එස්.එම්. ජයරත්න මයා
5. ටී.සී.ජේ. පෙරේරා මයා
6. සී.එස්. ජයසේකර මයා
7. කේ.ඒ. රූපානන්ද මයා
8. පී.ජී.අයි.ආර්. කුමාර මයා
9. එච්.ඒ. එරික් සිසිර කුමාර මයා
10. එස්.ඒ.එස්.පී. පෙරේරා මයා
11. ඩී.ආර්. පරණමාන මයා
12. කේ.ජී. කපිල ප්‍රියන්ත මයා

13. ජී.කේ.එච්. ප්‍රභාත් මයා
14. ඩබ්.ඩී.ටී.එස්. ක්‍රිශාන්ත මයා
15. එම්.ආර්.එන්. අපෝන්සු මයා
16. ආර්.එම්.ජේ.පී. නිශ්ශංක මයා
17. යූ.ඕ.එස්. ගුණරත්න මයා
18. කේ.එම්.ආර්. ශෂිමාල් මයා
19. ඩබ්.එස්. ලක්දුසිංහ මයා

<u>බේරුම්කරණ විභාග පටිපාටිය</u>

2022.08.26, 2022.09.21, 2022.10.19, 2022.11.04, 2022.11.30, 2023.01.19, 2023.02.13, 2023.03.22, 2023.05.03, 2023.06.14, 2023.07.11 හා 2024.01.01 යන දිනයන්හි දී මා විසින් මෙම බේරුම්කරණ විභාගය පවත්වා අවසන් කර ඇත. තව ද, පරීක්ෂණය සඳහා වෙනු කරනු ලැබූ දිනයන් කිහිපයක් විවිධ හේතූන් නිසා සංශෝධනය කිරීමට සිදු වූ බවද සඳහන් කරමි.

එකී ඉල්ලුම්කාර පාර්ශ්වය අංක 14 යටතේ සඳහන් වන වෙල්ගමගේ දොන් තිළිණ සමීර ක්‍රිශාන්ත නමැති අය ඉහත කී ඉල්ලුම්කාර පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් 19 දෙනා වෙනුවෙන්, එක්ව හා වෙන් වෙන්ව කරුණු දැක්වීම සඳහා ඔවුන්ගේ කැමැත්ත, අවසරය හා නියෝජිත බලය ලබා දී ඇත.

එකී ඉල්ලුම්කාර පාර්ශ්වය කියා සිටින්නේ ඔවුන් LECO ආයතනයට ඇතුළත් වීමෙන් අනතුරුව, අවම තනතුරුවලට ඔවුන් බඳවා ගැනීම සඳහා LECO ආයතනය විසින් 1997 සැප්තැම්බර් මස 14 වන දින Sunday Observer පුවත්පතේ පළ කරන ලද Post of Billing Trainees එනම්, “බිල්පත් පුහුණු වන්නන්”තනතුරේ සතුටුදායක පුහුණු කාල සීමාව නිමකළ පසුව LECO ආයතනයේ ආදායම් නිලධාරී” තනතුරුවලට පත්කරන ලද බවත්, ඒ වන විට ආයතනය තුළ සේවයේ යෙදී සිටි මෙම තනතුරුවලට අදාළ සේවා ගණයට අයත් සේවකයින් පිරිසක් LECO ආයතනය විසින් උපදේශන සේවාවක් ලබා ගන්නා ලද Teams නමැති කළමනාකරණ උපදේශක ආයතනයේ නිර්දේශ මත 1997.12.31 වන දින වන විට LECO ආයතනයේ සේවයේ නියැලි සිටි සියලුම ආදායම් නිලධාරීන් ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය නොසළකා ආයතනයට අදාළ වැටුප් පරිමාණ හා වැටුප් තල උපලේඛනයේ A-5 වැටුප් තලයේ පිහිටුවීමට නිර්දේශ කර ඇති බවත්, LECO ආයතනය තුළ 1997.12.31 වන දින වන විට සේවය කරන ලද සියලුම ආදායම් නිලධාරීන් A-5 වැටුප් පරිමාණයේ පිහිටුවා ඇති බවයි.

එහෙත් LECO ආයතනය විසින් මෙම ඉල්ලුම්කාර පාර්ශ්වයට අදාළ පිරිස බඳවා ගැනීම උදෙසා පළ කරන ලද පුවත්පත් දැන්වීම් ප්‍රකාරව එහි සඳහන් නියමයන්ට අනුව ඔවුන් බඳවාගත් බිල්පත් පුහුණු වන්නා තනතුරුවල පුහුණුව සතුටුදායක ලෙස නිම කිරීමෙන් අනතුරුව, ආදායම් නිලධාරි තනතුර ලබා දී ඇති බවත්, පුවත්පත් දැන්වීමේ සඳහන් කරන ලද පරිදි ඔවුන්ට මාසිකව රු. 7,000/-කට නොඅඩු වැටුප් තලයක පිහිටුවා ඔවුන් සේවක/වැටුප් පරිමාණය A-3 හි ස්ථානගත කර ඇත.

තවද, ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් කරුණු ඉදිරිපත් කිරීමේදී සඳහන් කරන ලද Teams ආයතනයේ නිර්දේශයන්ට අනුව ආයතනයේ සේවකයන් වර්ගීකරණය කිරීමේදී සාමාන්‍යාධිකාරි ඇතුළු කළමනාකරුවන් M ශ්‍රේණියට ද, ඉංජිනේරුවන් E ශ්‍රේණියට ද, ආදායම් නිලධාරීන් හා ලිපිකාර කටයුතු වල නිරත වන සේවකයන් A ශ්‍රේණියට යටතේ ද බඳවාගෙන ඇත.

තවද, ඉල්ලුම්කාර පාර්ශ්වයේ පැමිණිලිකරුවන් 19 දෙනාට A-5 වැටුප් තලයට හිමිකමක් තිබේද? යන්න පරීක්ෂා කිරීමේදි වගඋත්තරකාර ආයතනයේ පහත දක්වනු ලබන ලේඛන හා ක්‍රියාකාරකම් පිළිබඳව බේරුම්කරණයේ විශේෂ අවධානය යොමු කරන ලදී.

1. වගඋත්තරකාර ආයතනය විසින් 1997 දෙසැම්බර් මාසයේදී TEAMS නමැති කළමනාකරණ උපදේශක ආයතනයක් මගින් ලබා ගන්නා ලද Job Evaluation and Salary Review ” නමැති වාර්තාව

2. LECO ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වාර්තාවේ උපුටා ගැනීම Board Paper No. 98/03/03
Item 5 : Job Evaluation and Salary Revision - 1998.

3. LECO ආයතනය 1998.03.18 වන දින පවත්වන ලද අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වාර්තාව.

4. LECO ආයතනයේ 1998.03.18 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවේ 4 වන ඡේදය. "We have examined the report submitted by the and recommended the acceptance of same and implementation of the proposed salary scales හා

tables 7.3, 8.4 and 8.5 given හා "Management Guide" Volume of the Final Report, with effect from 01 January 1998.

It's proposed to pay an_interim salary increases of 6.0% and thereafter carry out the salary planned individually.

(වග උත්තරකාර පාර්ශ්වය)

5. 1997 සැප්තැම්බර් 14 දින sunday observer පුවත්පතේ පළ කරන ලද LECO ආයතනයේ බිල්පත් පුහුණුවන්නා තනතුරට බඳවා ගැනීමට අදාළ පුවත්පත් දැන්වීම.

6. වගඋත්තරකාර ආයතනය (LECO) විසින් නිකුත් කරන ලද පැමිණිලිකරුවන් විසින් එම ලිපියේ සඳහන් කොන්දේසි හා වගන්තිවලට යටත්ව අදාළ දිනවලදී භාරගන්නා ලද '' ආදායම් නිලධාරි තනතුර III ශ්‍රේණියට" ශීර්ෂයෙන් යුතු පත්වීම් ලිපි අන්තර්ගතයෙහි ''වේතනය" නමැති කොන්දේසිය/වගන්තිය අනුව පත්වීම්ලාභියා A-3 රුපියල් 7765/- x 110 x 15 රු. 9415/- වැටුප් පරිමාණයේ සියළු ගෙවීම් ඇතුළත්ව මසකට රුපියල් 7765/- ක වැටුපක් ගෙවනු ලැබේ යනුවෙන් සඳහන්ව ඇති අතර, එම ලිපියේම පත්වීම්ලාභියා එකී සේවා කොන්දේසි/වගන්තියට යටත්ව පාලනය වන බව හොඳාකාරවම තේරුම්ගත් බව පිළිගෙන අත්සන් කර ඇත.

(LECO) ආයතනය විසින් 2002.06.08 දිනැතිව නිකුත් කරන ලද Job No. 25 " Designation of Revenue Officers (Field) - Job Description අන්තර්ගතයන් එහි Salary Grade ලෙස සඳහන් වන්නේ A5 වැටුප් තලය වේ.

7. වගඋත්තරකාර ආයතනය මගින් ලබා ගන්නා ලද පැහැදිලි කිරීම් ලිපිය හා ඇමුණුම්

8. 2017.03.01 වන දින LECO ආයතනයේ මානව සම්පත් හා පරිපාලන අංශ ප්‍රධානි හා සේවක සංගම් නියෝජිතයන් අතර සමාගමේදී පැවති සාකච්ඡාවේ සටහන්.

එහිදි ආදායම් නිලධාරීන්ගේ සංගමය වෙනුවෙන් සහභාගි වන්නන්ගේ අංක 15, 16, 17 යටතේ නියෝජිතයන් තිදෙනෙකු සහභාගි වී තිබුණද, මෙම පැමිණිලිකරුවන් ඉදිරිපත් කරන ආදායම් නිලධාරීන් බඳවා ගැනීම III ශ්‍රේණියට හෝ A3 - A5 හෝ වැටුප් තලයන් පිළිබඳව කිසිදු ඉල්ලීමක් හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවට කිසිදු සටහනක් නිරීක්ෂණය නොවේ. ඒ අතර මෙම පැමිණිලිකාර පාර්ශ්වය විසින් මෙම ඉල්ලීම LECO ආයතනය වෙත ඉදිරිපත් කර ඇත්තේ 2019 වර්ෂයේදී වන අතර, එය ඔවුන් බඳවා ගැනීමට අවුරුදු 20කට පසුවය.

එහෙත් ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් කරුණු ඉදිරිපත් කිරීමේදි Themes යන වාර්තාවේ Table_8.4 present and proposed salary scales for — non-Engineering Jobs යන වගුව පිළිබඳව අවධානය යොමු කිරීමේදී Present හා Proposed යනුවෙන් රැකියා අංක (25)හා (26) පිළිවෙලින් Revenue Officer (Field) හා Revenue Officer (Depot) සඳහා ලකුණු පිළිවෙලින් 181 හා 183 ක් ලෙස සඳහන් කර ඇත. එහෙත් එම කරුණු (Facts) වලින් ඉදිරියට බඳවා ගනු ලබන Revenue Officer තනතුර සඳහා පත්වීම් ශ්‍රේණිය, වැටුප් තලය A3 ද A5 ද යන්න නිශ්චය කර ගැනීමට අදාළ නිර්දේශයන් පිළිබඳව පැහැදිලි නොවුණද, මෙම Themes වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා LECO ආයතනයේ අධ්‍යක්ෂණ මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින් එම කරුණද බේරුම්කරණයේ විශේෂ අවධානයට යොමු කරනු ලැබිනි.

10. තවද, වගඋත්තරකාර ආයතනයේ කරුණු ඉදිරිපත් කිරීමට අනුව අදාළ ඉල්ලුම්කරුවන් සිය පත්වීම් ලිපි භාර ගැනීමේදි, එකී පත්වීම් ලිපිවල ප්‍රධාන කොන්දේසියන් වන A3 වැටුප් පරිමාණය යටතේ බඳවා ගැනීමට හෝ ඔවුන් A5 වැටුප් තලයේ තැබිය යුතු බවට ව්‍යංග කොන්දේසියක් හෝ කළමනාකාරිත්වය හා සේවක සංගම් අතර සාමූහික ගිවිසුමක් (Collective Agreement) තිබූ බවට කිසිදු කරුණක් ඉදිරිපත් නොවුණි. එහෙත් බේරුම්කරණයේ විසඳුමක් සඳහා ඔවුන්ගේ වැටුප් විෂමතාවය සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් ජෙනරාල්වරයා වෙත පැමිණිලිකරුවන් විසින් ඉල්ලුම් කර ඇත්තේ 2019 වර්ෂයේදීය.

11. තවද, ආයතනය විසින් ඉහත නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් ගෙන තිබුණද, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදි ඉහත කී ආදායම් නිලධාරීන් තනතුරට බඳවා ගැනීම පිළිබඳව අදාළ වන වැටුප් තලය A5 පිළිබඳව අංක 8, 8.4 වගුවල සඳහන් කරුණු පිළිබඳව ආයතනයේ මානව සම්පත් කළමනාකාරීත්වයට යම් කිසි අතපසුවීමක් සිදුවී ඇති බවට අදාළ කරුණ අධ්‍යනයේදී නිරීක්ෂණය වෙනවා මෙන්ම මීට පෙර බේරුම්කරණයට ඉදිරිපත් වූ පැමිණිල්ලක් විභාග කිරීමේදි අංක A/10/2023 දරන බේරුම්කරණ ක්‍රියා පටිපාටියේදි LECO ආයතනයේ කළමනාකාරිත්වය විසින් මෙම අතපසු වීම පිළිබඳව යම්කිසි පිළිගැනීමක් සිදු වූ බවට කරුණු ඉදිරිපත් වී ඇත.

එමෙන්ම මෙම ඉල්ලුම්කරුවන් විසින් ඔවුන් සිය තනතුරුවලට බඳවා ගැනීමෙන් අවුරුදු 20 කට පසුව අතීතයට බලපාන පරිදි වැටුප් තලය සංශෝධනය කරන ලෙස ඉල්ලූම් කිරීම පිළිබඳව පළමු පාර්ශ්වය විසින්ද සිය අයිතිවාසිකම් පිළිබඳ සැළකිය යුතු අතපසුවීම් සිදු කර ඇති බවට නිරීක්ෂණය වේ.

**ප්‍රදානය**

එබැවින් අදාළ ඉල්ලුම්කරුවන් දහනම ( 19 ) දෙනාට පමණක් පෞද්ගලික වන සේ ඔවුන් දැනට ආදායම් නිලධාරි A - 5 දරන වැටුප් තලයට පත්කරන ලද දිනය වර්ෂ 6 කින් පෙරදාතම් කිරීමටත් වගඋත්තරකාර ආයතනයේ මූල්‍ය තත්වය හා අභ්‍යන්තර කාර්මික සාමයේ යහපැවැත්ම ගැන සලකා බලමින් එකී පෙරදාතම කිරීම වෙනුවෙන් ආයතනය විසින් ගෙවීමට සිදුවන හිඟ වැටුප් නොවේමටත්, පෙරදාතම් කිරීම නිසා අදාළ පැමිණිලිකරුවන් දහනම දෙනාට හිමිවිය යුතු නව වැටුප් තලයන් 2024.07.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ගෙවීම් කර ඒ බව මෙම ප්‍රදානය ගැසට් ගත කිරීමෙන් මසක් ඇතුළත සහකාර කම්කරු කොමසාරිස් නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත වාර්තා කරන ලෙසත් නියම කරමි. මෙම තීරණය පැමිණිලිකාර පාර්ශ්වය මෙන්ම වග උත්තරකාර ආයතනය යන දෙපාර්ශ්වයේම අතපසුවීම් පිළිබඳව සලකා බලා කරනු ලබන සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට නිගමනය කරමි.

ආචාර්ය **කේ. ඒ. එස්. කීරගල**,
බේරුම්කරු.

2024 ජුනි මස 10 වැනි දින,
බේරුම්කරණ හා කාර්මික අධිකරණයේ දීය.

EOG 07 - 0231

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.